සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# மூன்றாந் தவணை பரீட்சை - 2021
# Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 9 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I-II | පැය / மணித்தியாலம் / Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

- පහත සඳහන් ඒ ඒ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

01. සම්බුද්ධ පරිනිර්වාණය සිදුවූයේ,
    (1) පාවා නුවරදීය. (2) කුසිනාරා නුවරයි.
    (3) විශාලා මහ නුවරදීය. (4) සැවැත් නුවරදීය.

02. තථාගත බුදුරජාණන් වහන්සේ සෝපාදිසේස පරිනිබ්බාන ධාතුවට පත් වූයේ,
    (1) තිස්වන වියේදීයි. (2) තිස්පස්වන වියේදීයි.
    (3) අසූවන වියේදීයි. (4) අසූපස්වන වියේදීයි.

03. බෞද්ධයෙකු විසින් දැක සංවේගය උපදවා ගත යුතු ස්ථාන සතරක් පිළිබඳව සම්බුද්ධ දේශනාවෙහි සඳහන් වෙයි. ඉන් එක් ස්ථානයක් වනුයේ,
    (1) සැවැත්නුවර ජේතවනාරාමයයි. (2) රජගහනුවර වේළුවනාරාමයයි.
    (3) බරණැස්නුවර ඉසිපතනාරාමයයි. (4) පැළලුප්නුවර අශෝකාරාමයයි.

04. තම ශ්‍රාවක පිරිසගේ දක්ෂතා හා ප්‍රවීණතා හඳුනාගෙන ඒ අනුව තනතුරු ලබාදුන් බුදුරජාණන් වහන්සේ ප්‍රඥාවන්තයින් අතර අගතනතුර පිරිනැමුවේ,
    (1) සැරියුත් තෙරුන් වහන්සේටයි. (2) මුගලන් තෙරුන් වහන්සේටයි.
    (3) මහා කාශ්‍යප තෙරුන් වහන්සේටයි. (4) ආනන්ද තෙරුන් වහන්සේටයි.

05. නිතර නිතර පුරුද්දක් ලෙස කරනු ලබන කුසලාකුසල කර්ම අයත් වනුයේ,
    (1) ගරුක කර්මයන්ටයි. (2) ආසන්න කර්මයන්ටයි.
    (3) ආචින්න කර්මයන්ටයි. (4) කටත්තා කර්මයන්ටයි.

06. කෙලෙස් නැමැති ගිනි සම්පූර්ණයෙන් නිවී සියලු දුක් නිමාවීම ක්ලේශ පරිනිර්වාණයයි. ඒ පිළිබඳ සඳහන් වන ආර්යය සත්‍ය වනුයේ,
    (1) දුක්ඛ ආර්ය සත්‍යයි. (2) දුක්ඛ සමුදය ආර්ය සත්‍යයි.
    (3) දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයි. (4) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයි.

07. භික්ෂුණී ශාසනය පිහිටුවීමෙලා පුරෝගාමී මෙහෙයක් ඉටුකරනු ලැබූයේ,
    (1) ආනන්ද තෙරුන් වහන්සේය. (2) අනුරුද්ධ තෙරුන් වහන්සේයි.
    (3) අස්සජි තෙරුන් වහන්සේය. (4) නන්ද තෙරුන් වහන්සේයි.

08. බුදුරජාණන් වහන්සේ විසින් මහා ප්‍රජාපතී ගෝතමිය ඇතුළු කාන්තාවන්ට පැවිද්ද හා උපසම්පදාව ලබාදීමේදී පිළිගත යුතු යැයි පනවා වදාළ ධර්මයන් වූයේ,
    (1) සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන්ය. (2) සප්ත අපරිහානි ධර්මයි.
    (3) අෂ්ටලෝක ධර්මයන්ය. (4) අෂ්ට ගරු ධර්මයන්ය.

09. බුදුන් වහන්සේ භෝග විනාශයට හේතුවන කරුණු හයක් පිළිබඳව හඳුන්වා දෙනු ලබන්නේ,
    (1) උපාලි ගෘහපතියාටයි. (2) සිගාලක ගෘහපතියාටයි.
    (3) ඡත්ත මානවකයාටයි. (4) දීඝජානු කෝලිය පුත්‍රයාටයි.

10. රටක නීතිය, සාමය හා සදාචාරය රැකීමට ඉවහල් වන රාජ්‍ය පාලන ප්‍රතිපත්ති අතර ''කාන්තාවන්ට හිරිහැර නොකළ යුතුයි'' යන කරුණ ඇතුළත් වනුයේ,
(1) දස සක්විති වත් තුළයි. (2) දසරාජ ධර්මවලයි.
(3) සතර සංග්‍රහ වස්තුවලයි. (4) සප්ත අපරිහානී ධර්මවලයි.

11. කුලවාදයේ ඇති තීර්ථක බව පෙන්වා දීමට බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍ර දේශනාවකි.
(1) අග්ගඤ්ඤ සූත්‍රය (2) වාසෙට්ඨ සූත්‍රය
(3) දුප්පත්තිතාර සූත්‍රය (4) වේළුද්වාර සූත්‍රය

12. වප්මඟුල් උළෙල දින සිදුහත් කුමරු දඹරුක් සෙවණෙහි පළඟ බැඳ වඩන ලද භාවනාව වූයේ,
(1) මෛත්‍රී භාවනාවයි. (2) ආනාපානසති භාවනාවයි.
(3) මරණානුස්සති භාවනාවයි. (4) බුදුගුණ භාවනාවයි.

13. සම්බුද්ධ ශාසනයෙහි ''අභිඥලාභී'' භික්ෂුණීන් අතර අග තනතුර හිමිකර ගත් රහත් තෙරණිය වූයේ,
(1) ප්‍රජාපතී ගෝතමී තෙරණියයි. (2) පටාචාරා තෙරණියයි.
(3) භද්දකච්චානා තෙරණියයි. (4) උප්පලවන්නා තෙරණියයි.

14. ''ධම්මපදය'' නම්වූ ධර්ම ග්‍රන්ථය අයත් වන්නේ සූත්‍ර පිටකයේ,
(1) දීඝ නිකායටයි. (2) සංයුක්ත නිකායටයි.
(3) මජ්ඣිම නිකායටයි. (4) ඛුද්ධක නිකායටයි.

15. තමන්ගේ දියුණුව මෙන්ම අනුන්ගේ දියුණුව දැක සතුටුවීමේ ගුණය,
(1) මෙත්තාවයි. (2) කරුණාවයි.
(3) මුදිතාවයි. (4) උපේක්ෂාවයි.

16. පව්කම් නොකිරීම, තොරවීම හා අනුමත නොකිරීම යන තුන් ආකාරයෙන්ම සීලය ආරක්ෂා කිරීම,
(1) අත්තූපනායික ධර්මයයි. (2) ත්‍රිකෝටි පාරිශුද්ධ ධර්මයයි.
(3) ලෝක පාලක ධර්මයයි. (4) අධිපති ධර්මයයි.

17. සතුන් මැරීම, සොරකම් කිරීම හා කාමයෙහි වරදවා හැසිරීම යන වැරදි ක්‍රියාවලින් වෙන්ව යහපත් ක්‍රියාවල නිරතවීම අයත් වන්නේ,
(1) සම්මා සංකප්පයටයි. (2) සම්මා කම්මන්තයටයි.
(3) සම්මා ආජීවයයි. (4) සම්මා වායාමයයි.

18. බුදුරජාණන් වහන්සේට අවසන් දානය පූජා කරණු ලැබුවේ,
(1) අනේපිඬු සිටුතුමා (2) සුජාතා සිටුදේවිය
(3) කොසොල් රජතුමාය (4) චුන්ද කර්මාර පුත්‍රයායි

19. සිඟාලෝවාද සූත්‍ර දේශනාවෙහි ඇතුළත් වන යුතුකම් ඉටුකිරීම පිළිබඳ ඉගැන්වීමට අනුව රසවත් ආහාර පාන බෙදදීම යන යුතුකම,
(1) ස්වාමියා විසින් සේවකයාට ඉටුකළ යුතුය.
(2) සේවකයා විසින් ස්වාමියාට ඉටුකළ යුතුය.
(3) භාර්යාව විසින් ස්වාමි පුරුෂයාට ඉටුකළ යුතුය.
(4) ස්වාමි පුරුෂයා විසින් භාර්යාවට ඉටුකළ යුතුය.

20. අසීමිත ආශාවෙන් තොරව ලද දෙයින් සතුටුවීමේ උතුම් ගුණය හැඳින්වෙන්නේ,
(1) සුභර ගුණය නමිනි. (2) සන්තුස්සක ගුණය නමිනි.
(3) නිපක ගුණය නමිනි. (4) සන්තින්ද්‍රිය ගුණය නමිනි.

(ලකුණු 2 × 20 = 40)

---

## II පත්‍රය

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු ලියන්න.

01. (i) නිවන අරමුණු කොටගෙන මධ්‍යම ප්‍රතිපදවෙහි ගමන් කරන්නෙකු විසින් අත්හල යුතු අන්ත **දෙක** මොනවාද?

(ii) දනාදි පුණ්‍ය ලාභීන් අතර අග්‍ර ගණ්‍ය වූ රහතන් වහන්සේ කවුද?

(iii) අටලෝ දහමට අයත් අංග **හතරක්** නම් කරන්න.

(iv) ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි.'' යන පාඨයේ තේරුම ලියන්න.

(v) බුද්ධ දේශනාවට අනුව මිනිසාට ලබාගත හැකි උසස්ම ලාභය කුමක්ද?

(vi) ශාරීරික නිරෝගීතාව උදෙසා අනිවාර්යයෙන්ම ආරක්ෂා කළයුතු පංච ශීලයට අයත් ශික්ෂා පද **දෙක** මොනවාද?

(vii) ආහාර අනුභවයේදී ඔබ සැළකිලිමත් වියයුතු කරුණු **දෙකක්** ලියන්න.

(viii) නිරෝගී පුද්ගලයෙකු වීමට නම් අංශ දෙකකින් නිරෝගී විය යුතුය. එම අංශ **දෙක** මොනවාද?

(ix) ගිහියාගේ නිත්‍ය සීලය කුමක්ද?

(x) පරිසරය රැක ගැනීමට අප ගත යුතු ක්‍රියාමාර්ග **දෙකක්** ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

02. නිමල දහම රකිනු පිණිස ගැටළු විසඳන සසුන් පිළිවෙත සංගායනා පැවැත්වීමයි. එසේ පැවැත්වූ,

(i) තෙවන ධර්ම සංගායනාවට බලපෑ ප්‍රධාන හේතුව කුමක්ද? (ලකුණු 02)

(ii) එම ධර්ම සංගායනාවේ ප්‍රධානත්වය ගත් රහතන් වහන්සේ, අනුග්‍රහය දැක්වූ රජතුමා හා පැවැත්වූ ස්ථානය නම් කරන්න. (ලකුණු 03)

(iii) ශාසනයේ ආරක්ෂාව හා පැවැත්ම උදෙසා තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල හේතු ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 05)

03. බුදුදහම ලෝකෝත්තර විමුක්තිය මෙන්ම ලෞකික ජීවිතය සාර්ථක කරගෙන සැනසිලි දයක හා ප්‍රීතිමත් ජීවිතයකට මඟ පෙන්වන ප්‍රායෝගික දහමකි.

(i) දැහැමිව හා සාධාරණව ධනය උපයා ජීවත්වීම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ කුමන අංශයට අයත්වේද? (ලකුණු 02)

(ii) බුදුදහමින් ප්‍රතික්ෂේප කර ඇති වෙළඳාම් 05 කි. එයින් **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) අදැහැමි ධනෝපායන මාර්ගවලින් මිදී නිවැරදි ජීවිතයක් ගත කිරීමෙන් තමාට මෙන්ම අන්‍යයන්ටද වන යහපත පෙන්වා දෙන්න. (ලකුණු 05)

04. ''තමාට අහිත පිණිස පවතින අයහපත් දේ කිරීම පහසුය. තමාට හිත පිණිස පවතින දේ කිරීම අපහසුය.''

(i) මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාව බුදුරජාණන් වහන්සේ දේශනා කළේ කවුරුන් මුල්කරගෙනද? (ලකුණු 02)

(ii) ''සුකරානි අසාධුනි....'' මෙම ගාථාවේ ඉතිරි පද ලියා ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 03)

(iii) තමාට යහපත පිණිස පවතින හොඳ ක්‍රියා කිරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන **පහක්** ලියන්න. (ලකුණු 05)

05. ''හෙළ කලා කෙත සරු වූයේ බුදුසමයේ ආභාෂයෙනි.''

(i) බුදුදහමේ ආභාෂයෙන් පෝෂණය වූ කලා ශිල්ප **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(ii) පොළොන්නරු සාහිත්‍ය යුගයට අයත් සාහිත්‍ය ග්‍රන්ථ **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) ඉන් එක් සාහිත්‍ය ග්‍රන්ථයක් පිළිබඳව හඳුන්වාදී, ධර්ම සාහිත්‍යය මගින් අපට ලැබෙන ප්‍රයෝජන මොනවාදැයි පෙන්වා දෙන්න. (ලකුණු 05)

06. (i) බුදුරජාණන් වහන්සේ තුළ පැවති ''යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී'' ගුණය යනු කුමක්ද? (ලකුණු 02)

(ii) ඉහත ගුණයට අමතරව බුද්ධ චරිතයෙන් ප්‍රකට වන විශිෂ්ට නායකත්ව ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) එම නායකත්ව ලක්ෂණවලින් එකක් බුද්ධ චරිතයෙන් ප්‍රකට වන අවස්ථාවක් ලියා එම නායකත්ව ලක්ෂණ ඔබ තුළ වර්ධනය කර ගැනීමට ක්‍රියා කරන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

(i) බුදු බව පැතූ බලංගොඩ ආනන්ද මෛත්‍රී මහා නායක හාමුදුරුවෝ

(ii) ආනාපානාසති භාවනාව

(iii) බෞද්ධයන්ගේ අත්පොත බඳු වූ ධම්මපදය

(iv) බෞද්ධ කලා ශිල්ප (ලකුණු 5 × 2 = 10)

✶✶✶